**ජා-ඇල ප්‍රාදේශීය සභාව**
**--------------------------**
**ගම්පහ දිස්ත්‍රික්කය**
**------------------**

1. මූල්‍ය ප්‍රකාශන
------------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.
---------------------------------

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 29 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 සැප්තැම්බර් 25 දින ලේකම්වරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය
--------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට ජා-ඇල ප්‍රාදේශීය සභාවේ සභාවේ මූල්‍ය තත්ත්වය හා එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
-----------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
------------------------

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) පරිත්‍යාග වශයෙන් පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් ලද පිරිවැය රු.550,000 ක් වූ බ්‍රේලින් යන්ත්‍රයේ වටිනාකමට, රු.82,500 ක් වූ එහි එකතුකළ අගය මත බදු වටිනාකමද ඇතුලත් කර ගිණුම්ගත කර තිබීමෙන් යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ එම වටිනාකමින් වැඩියෙන් ගිණුම් ගත කර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළ මිලදී ගෙන තිබූ රු.32,000 ක් වටිනා ජල පොම්පයක් හා රු.215,200 ක් වටිනා මුද්‍රණ යන්ත්‍ර 02 ක් ප්‍රාග්ධනිත කර නොතිබුණි.

(ඇ) දැන්වීම් පුවරු ප්‍රදර්ශනය කිරීම සඳහා පෞද්ගලික ආයතනයකින් ලැබී, අදාල සේවාව නොසැපයීම මත අගරු කර තිබූ රු.71,000 ක් වූ චෙක්පතෙහි මුදල් අයකර ගැනීමට නොහැකි බව 2017 නොවැම්බර් 10 දින තහවුරු වී තිබියදීත් ගිණුම්වල ණයගැතියන් ලෙස දක්වා තිබුණි.

(ඈ) මීගමුව ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් 2017 පෙබරවාරි 15 දින ලද මුද්දර ගාස්තු රු.5,691,254 ක් වැටුප් ප්‍රතිපූර්ණ ලැබීම් ලෙස ගිණුම් ගත කිරීමෙන් මුද්දර ආදායම එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඉ) කඳාන උපකාර්යාලයට අයත් රු.193,057 ක කපා හරින ලද හිඟ වරිපනම් ආදායම, දුන් වට්ටම් ලෙස ගිණුම් ගත කර තිබුණි.

1.3.2 නොසැසඳුණු ගිණුම්
-------------------------
සමාලෝචිත වර්ෂය තුළ ගබඩාවට මිලදී ගත් රු.21,798,560 ක භාණ්ඩ තොග, පොදු ගබඩා ගිණුමට ගිණුම් ගත කර තිබුණද ,ගබඩාවේ ලැබීම් පත්‍ර අනුව එය රු.24,514,290 ක් වූයෙන් රු.2,715,730 ක වෙනසක් විය.

1.3.3 අවිනිශ්චිත ගිණුම
--------------------
රු. 236,425 ක් වූ අවිනිශ්චිත ගිණුමේ බැර ශේෂය වර්ෂ ගණනාවක සිට ඉදිරියට පැවත එන නමුත්, එය හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

1.3.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්
-----------------------------------
ලැබිය යුතු ගිණුම්
--------------------
දිගින් දිගටම පැවත එන ගිණුම් විෂයයන් 11 ක එකතුව රු. 12,843,561 ක ශේෂයන් සනාථ කිරීමට උපලේඛන හෝ තොරතුරු කිසිවක් සභාව සතු නොවූ අතර, මේවා හඳුනාගෙන නිරවුල් කර ගැනීමටද කටයුතු කර නොතිබුණි.තවද මේ පිළිබඳ කාල විශ්ලේෂණයක්ද ඉදිරිපත් කිරීමට සභාව අපොහොසත් විය.

1.3.5 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම
-----------------------------------------------------
තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම
----------------------------------------------
උපලේඛන ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.899,911 ක් වූ ගිණුම් විෂයයන් 02 ක් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

1.3.6 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම
---------------------------------------------------------------------------
නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති,රීති ,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|
| | රු. | |
| (අ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති | | |
| (i) 17 වන රීතිය | - | උප පත්‍රිකා පොත් පී.එස් 21 ආකෘතියේ වූ ලැබීම් හා නිකුත් කිරීම් ලේඛනයක සටහන් කර නොතිබුණි. |
| (ii) 19 වන රීතිය | - | සභාවේ උපපත්‍රිකා පොත් ගබඩාවේ රාක්කවල අසුරා තිබූ අතර පාවිච්චි කළ සියලු උප පත්‍රිකා පොත් සහතික කර |

| | | | |
|---|---|---|---|
| | | | නොතිබුණි. තවද ඒවා ආපසු බාරදීම සම්බන්ධයෙන් කිසිදු සටහනක් උප පත්‍රිකා ලේඛනයේ නොවීය. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි අංක 571 | 8,346,765 | ලේඛන අනුව තැන්පත් කර වර්ෂ 2 ඉක්මවා තිබූ රු.1,742,029 ක් වූ ටෙන්ඩර් තැන්පතු හා රු.6,604,736 ක් වූ මිශ්‍ර තැන්පතු නියාදනය කිරීමට කටයුතු කර නොතිබූ අතර පිළිවෙලින් එයින් රු.723,490 ක් හා රු.1,718,590 ක් වර්ෂ 5 ඉක්මවා තිබුණි. |
| (ඇ) | 2016 මැයි 26 දිනැති පළාත් පාලන කොමසාරිස්ගේ අංක LGD/05/2016 දරන චක්‍රලේඛය | 22,407,788 | වරිපනම් අයකර ගැනීම සඳහා බලපත්‍රයක් නිකුත් කිරීම, එය ක්‍රියාත්මක කිරීම, ඒ අනුව අයවිය යුතු වරිපනම් හා වරෙන්තු ගාස්තු අයකිරීම ලිත් වර්ෂයක් තුළ නිම කිරීම නාගරික ලේකම්ගේ කාර්ය වන අතර ඒ අනුව කටයුතු කර නොතිබුණි. |

1.3.7 ප්‍රමාණවත් අධිකාරි බලයකින් තහවුරු නොවූ ගණුදෙනු

---------------------------------------------------------

මස් කඩ හිඟ කුලි රු.2,910,817 ක්, හිඟ බදු කුලී රු. 69,700 ක් හා හිඟ වරිපනම් රු.2,158,654 ක් වශයෙන් මුළු එකතුව රු.5,139,171 ක් ගිණුමේ ශේෂ නිවැරදි කිරීම් ලෙස දක්වා සමුච්චිත අරමුදලට එරෙහිව කපාහැර තිබූ අතර ඒ සඳහා විෂය භාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගෙන නොතිබුණි.

2. මූල්‍ය සමාලෝචනය

---------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල

----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 75,969,197 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 21,124,262 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

-------------------------

2.2.1 ඇස්තමේන්තුගත ආදායම් , බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

-------------------------------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්,බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ

| | ආදායම් ප්‍රභවය | 2017 ඇස්තමේන්තු ගත ආදායම | 2017 බිල් කළ ආදායම | 2017 රැස්කළ ආදායම | 2017 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2016 ඇස්තමේන්තු ගත ආදායම | 2016 බිල් කළ ආදායම | 2016 රැස්කළ ආදායම | 2016 දෙසැම්බර් 31 දිනට මුළු හිගය |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 |
| (i) | වරිපනම් හා බදු | 44,645 | 52,329 | 51,739 | 25,289 | 76,406 | 49,892 | 50,839 | 28,613 |
| (ii) | කුලී | 14.439 | 17,519 | 17,424 | 8,965 | 14,449 | 13,983 | 13,783 | 9,608 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 2,794 | 2,423 | 3,751 | 93 | 5,084 | 3,447 | 3,510 | 93 |
| (iv) | වෙනත් ආදායම් | 135,652 | 80,365 | 70,914 | 916 | 117,495 | 81,585 | 80,327 | 949 |

### 2.2.2 ආදායම් රැස් කිරීමේ කාර්ය සාධනය

(අ) ඉකුත් වර්ෂය අවසානයට තිබූ රු.93,800 ක බලපත්‍ර ගාස්තු හිඟය එලෙසින්ම පැවතිණි.

(ආ) සමාලෝචිත වර්ෂයට ඇස්තමේන්තුගත වෙනත් ආදායමින් බිල් කිරීම් කර තිබුණේ සියයට 59.24 ක් පමණක් වන හෙයින් ඇස්තමේන්තුගත ආදායම් ඉලක්කය කරා ළඟාවී නොතිබුණි.

### 2.2.3 වරිපනම් හා බදු

පළාත් පාලන කොමසාරිස්ගේ 2016 මැයි 26 දිනැති අංක LGD/05/2016 දරන චක්‍රලේඛය ප්‍රකාර හිඟ වරිපනම් සඳහා දේපල තහනමට ගැනීමට බලපත්‍රයක් නිකුත් කර ඇත්තේ නම් පමණක් වරිපනම් මුදලට අතිරේක ගාස්තුවක් අයකළ හැකි වුවත් 2017 මාර්තු 31 දිනට හිඟ වරිපනම් ශේෂය වූ රු.22,407,788 ක් සඳහා වරෙන්තු නිකුත් නොකිරීම හේතුවෙන් දඩ අයකර නොතිබුණි.

### 2.2.4 කුලී

(අ) ප්‍රාදේශීය සභාවට අයත් රාගම සුළු වෙළඳපලේ අංක 46 දරන වෙළඳ කුටිය 2011 ජනවාරි 01 දින සිට සාප්පුවක් හෝ එළවළු කඩයක් පවත්වාගෙන යාම සඳහා එළඹ තිබූ ගිවිසුමේ 04 වන වගන්තිය ප්‍රකාරව, සභාව විසින් අනුමත කරනු ලබන ව්‍යාපාර කාර්යයක් සඳහා පමණක් යොදාගත යුතු වුවද එය කුකුළු මස් අලෙවි කරන වෙළඳ සැලක් වශයෙන් පවත්වාගෙන ගොස් තිබූ බව 2017 අගෝස්තු 21 දින ස්ථානීය පරීක්ෂාවේදී අනාවරණය විය. රු.300 ක අඩු මාසික කුලියකට කුකුළු මස් කඩයක් ලෙස අනවසරයෙන් පවත්වාගෙන යාම නිසා මස්කඩ ටෙන්ඩර් කිරීම තුළින් ප්‍රාදේශීය සභාවට ඉහළ ආදායමක් ලබා ගැනීමට තිබූ අවස්ථාව අහිමිවී තිබූ අතර කුකුළු මස් ටෙන්ඩර් ලබාගත් බලපත්‍ර ලාභීන්ටද අසාධාරණයක් වී තිබුණි. වෙළඳ සැල් හිමියා විසින් බලපත්‍රයක් නිකුත් කරන ලෙස දන්වා නියෝගයක් ප්‍රකාශයට පත්කරන ලෙස 2017 මැයි මාසයේදී ගම්පහ දිසා අධිකරණයේ නඩුවක් පවරන තුරු සභාව විසින් ඒ සම්බන්ධයෙන් කටයුතු කර නොතිබූ අතර වෙළඳ කුටියේ සෞඛ්‍ය ආරක්ෂාව පිළිබඳව සභාවේ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ගේ අවධානයද යොමුවී නොතිබුණි.

(ආ) රාගම පොදු වෙළඳසැල අංක 01 කුකුළු මස් කඩය සඳහා 2017 දෙසැම්බර් 31 දිනට අයවීමට ඇති හිඟ මුදල වූ රු.158,681 ක් සම්බන්ධයෙන් ගිවිසුම් ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

2.2.5 උසාවි දඩ හා මුද්දර ගාස්තු
------------------------------

ගම්පහ ,කොළඹ හා මීගමුව ඉඩම් රේජිස්ට්‍රාර් කාර්යාලවලින් ලැබිය යුතු මුද්දර ගාස්තු 2014 වර්ෂයෙන් පසු ප්‍රාදේශීය සභාවට ලැබී නොමැති අතර ඒවා ගෙන්වා ගැනීමට කටයුතු කර නොතිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය
-------------------------

3.1 කාර්ය සාධනය
-----------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම,ජනතාවගේ සුබ විහරණය පහසුව හා සුභ සාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) ප්‍රතිපාදන සැලසීම
-------------------

(i) ඉකුත් වර්ෂයේ ස්වයං උත්පාදන ආදායම්වලින් ප්‍රාග්ධන වැය සඳහා සියයට 28.56 ක් යොදවාගෙන තිබුණත් සමාලෝචිත වර්ෂයේදී එය සියයට 18.59 ක් දක්වා පහළ බැස තිබුණි.

(ii) 2017 අයවැය ලේඛනය අනුව ප්‍රාදේශීය සභාවේ ප්‍රාග්ධන වැය සඳහා රු.25,000,000 ක ප්‍රතිපාදන සලසා තිබුණද රු.35,138,908 ක් වටිනා ව්‍යාපෘති 69 ක් සඳහා ගිවිසුම් ගතවීමෙන් අතිරික්ත මුදල මාර්ග නඩත්තු වැය ශීර්ෂයෙන් මාරු කරගෙන තිබුණි. ඒ හේතුවෙන් මාර්ග නඩත්තු කටයුතු සැලසුම් කළ ප්‍රමාණයට වඩා සියයට 33.3 කින් අඩුවී තිබුණි.

(iii) සමාලෝචිත වර්ෂයේදී ප්‍රාදේශීය සභාවේ මුළු ආදායම මිලියන 260 ක් වූ අතර, භෞතික සැලසුම්, මහා මාර්ග, පාලම් ඉදිකිරීම හා මහජන උපයෝගී සේවා යන ප්‍රාග්ධන වැය විෂයයන් සඳහා වෙන් කර තිබූ සම්පූර්ණ මුදල මිලියන 35 ක් විය. ඒ අනුව වර්ෂයේ ආදායමින් ප්‍රාග්ධන වැය සඳහා වෙන් කළ මුදල සියයට 13.46 ක් වැනි අඩු ප්‍රතිශතයක් විය.

(ආ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය
------------------------------

සභාවට අයත් අක්කර 3 ½ ක පමණ භූමි ප්‍රදේශයෙන් අක්කර 01 ක පමණ ප්‍රමාණයක සභාවේ කොම්පෝස්ට් පොහොර අංගනය පිහිටුවා තිබෙන අතර ඉතිරි භූමි සීමාවේ කොටසක කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනයෙන් පසු ඉවතලන ඝන අපද්‍රව්‍ය බැහැර කරමින් තිබුණි. එම කසළ විවෘත භූමියේ ගොඩගසා තිබූ අතර පොහොර අංගනයට ආසන්නව ඇලක්ද පිහිටා ඇති හෙයින් වර්ෂාවත් සමඟ අපද්‍රව්‍ය සේදී ගොස් ජලය අපවිත්‍ර වීම සිදුවන බවද වාර්තා වී තිබුණි. අපද්‍රව්‍ය වැසීම සඳහා දිනපතා පස් යෙදීම සිදුකළ යුතු වුවත් ඉවතලන ඝණ අපද්‍රව්‍ය බැහැරලන ස්ථානයට 2016 පෙබරවාරි මාසයේදී පස් කියුබ් 50 ක් යෙදීමෙන් පසු නැවත පස් කියුබ් 50 ක් යෙදීම සිදුකර තිබුණේ 2017 ඔක්තෝබර් මාසයේදී විය. අදාල ස්ථානයේ කොම්පෝස්ට් අංගනය පමණක් පවත්වා ගෙන කසළ බැහැරලීම සඳහා වෙනත් සුදුසු ස්ථානයක් පවත්වා ගැනීමට කටයුතු කළ යුතු බව මධ්‍යම පරිසර අධිකාරිය විසින් 2018 මාර්තු 02 දින දන්වා තිබූ අතර ඒ අනුව 2017 වර්ෂය සඳහා ඉල්ලුම් කර තිබූ පරිසර ආරක්ෂණ බලපත්‍රය මෙතෙක් සභාව වෙත ලැබී නොතිබුණි.පළාත් පාලන කොමසාරිස්ගේ 2008 නොවැම්බර් 20 දිනැති අංක WNP/LPD/15/2008 දරන චක්‍රලේඛයෙන් කැළි කසළ ඉවත් කිරීමේදී පරිසරයට හිතකර විධිමත් ක්‍රමවේදයක් අනුගමනය කිරීම සහ ඒ සඳහා අඛණ්ඩ වූ වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කළ යුතු බව අවධාරණය කර තිබුණද, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ඇ) තිරසර සංවර්ධන ඉලක්ක

-----------------------------

එක්සත් ජාතීන්ගේ සංවිධානයේ තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් වූ 2030 න්‍යාය පත්‍රය පිළිබඳව සභාව විසින් දැනුවත්වීමක් සිදුව තිබුණද හඳුනාගෙන තිබූ සංවර්ධන ඉලක්ක කරා ළඟා වීමේදී අදාල කාර්යයන් නියාමනය කිරීම සඳහා අවශ්‍ය සංධිස්ථානයන් සමාලෝචිත වර්ෂයේදී හඳුනාගෙන නොතිබුණි.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

------------------------------------

(අ) ප්‍රාදේශීය සභාවේ දැක්ම ලෙස පොදු දන සුබසෙත සැලැසීම හඳුනාගෙන තිබුණද, මහජන පැමිණිලි නිරාකරණය කිරීම සම්බන්ධයෙන් ප්‍රාදේශීය සභාව මේ දක්වා ගෙන තිබූ ක්‍රියාමාර්ගවල ප්‍රගතිය ඉතා දුර්වල මට්ටමක පැවතුණි. සමාලෝචිත වර්ෂයේ ලැබී තිබූ මහජන පැමිණිලි 152 කින් පැමිණිලි 131 ක් සඳහා කිසිදු ක්‍රියා මාර්ගයක් ගෙන ඇති බවට වාර්තා කර නොතිබුණු අතර, පැමිණිලි 20 ක් සම්බන්ධයෙන් ගෙන තිබූ ක්‍රියා මාර්ගවල පසුවිපරම් කටයුතු සිදුකර නොතිබිණි.

(ආ) සභාවේ අතැති මාසික සාමාන්‍ය මුදල් ශේෂය රු.මිලියන 88 ක් වූ අතර එය අත රඳවා තබා ගැනීම තුළ ප්‍රදේශයේ ජනතාව වෙනුවෙන් ක්‍රියාත්මක කළ යුතු සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම අවම මට්ටමක පැවතුණි.

(ඇ) මූල්‍ය වටිනාකමක් ඇති පොළ ලදුපත් උප පත්‍රිකා පොත් 233 ක් හා වෙළඳ බලපත්‍ර පොත් 03 ක ඌනතාවය සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි.

.3.3 වත්කම් කළමණාකරණය

-----------------------------

3.3.1 පවරා නොගත් වත්කම්

--------------------------

(අ) ඉඩම් අනුබෙදුම් කිරීමේදී සභාවට පවරා ගෙන තිබූ උතුරු ඉදිමින්න ප්‍රදේශයේ වූ අක්කර 1 යි පර්චස් 38 ක භූමි ප්‍රදේශය තුළ අනවසර පදිංචිකරුවන්ගේ ඉදිකිරීම් 02 ක් තිබූ අතර සභාව විසින් එම ඉඩම්වල අයිතිය සුරක්ෂිත කරගැනීම සඳහා විධිමත් ක්‍රියා මාර්ගයක් ගෙන නොතිබුණි. මිනුවන්ගොඩ "ගාර්ඩන් සිටි" ඉඩම වෙන්දේසි කිරීමේදී, පොදු පහසුකම් වෙනුවෙන් ප්‍රාදේශීය සභාව වෙත ඉඩම් කොටසක් වෙන්කර දී තිබූ නමුත්, එම ඉඩම ඔප්පුවක් මගින් පවරා ගෙන නොතිබුණි.

(ආ) එක් එක් අමාත්‍යාංශය වෙතින් පරිත්‍යාග වශයෙන් ලැබී තිබූ ගලි බවුසරයක් හා ට්‍රැක්ටර් 03 ක් සභාවට පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

3.3.2 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය

--------------------------------

(අ) උද්‍යාන 02 ක හා ළමා හා මාතෘ සායන 12 ක වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සමාලෝචිත වර්ෂය වෙනුවෙන් සිදුකර නොතිබුණි.

(ආ) ප්‍රාදේශීය සභාවේ අයවැය ලේඛනය අනුව සභාව සතු ලෙස හඳුනා ගෙන තිබූ වාහන 05 ක භෞතික පැවැත්ම 2017 දෙසැම්බර් 31 දිනට සිදුකර තිබූ භාණ්ඩ සමීක්ෂණ වාර්තා මගින් තහවුරු නොවුණි.

3.4 ප්‍රසම්පාදනය

-------------

3.4.1 කොන්ත්‍රාත් පරිපාලනය

------------------------

(අ) සභා ශාලාව නවීකරණය සඳහා ප්‍රසම්පාදන සැලැස්මට අනුව රු.180,000 ක් වෙන්කර 2017 දෙසැම්බර් 13 දින ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කර තිබූ අතර ඒ සඳහා අතිරේකව දැරීමට සිදුවන පිරිවැය හැර ඇස්තමේන්තුගත වියදම රු.5,847,305 ක් විය. මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය කෙරේ.

(i) පිළියෙල කර තිබූ පිරිවිතර අදාල ප්‍රසම්පාදන අරමුණ සාක්ෂාත් කර ගැනීම සඳහා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.6.1 (අ) හා (ආ) හි විධිවිධානවලින් බැහැරව අවශ්‍ය ප්‍රමාණයට විස්තර කිරීම් කර නොතිබුණි. ඒ අනුව තාක්ෂණ කමිටු ඇගයීමේදී පිරිවිතර සඳහා නැවතත් සංශෝධනයන් කිරීමට සිදුව තිබූ අතර මෙම සංශෝධිත පිරිවිතරයන් සඳහා දැරීමට සිදුවන අතිරේක පිරිවැය සම්බන්ධයෙන් කොන්ත්‍රාත්කරු සමඟ නිශ්චිත එකඟතාවයන් ඇතිකරගෙන නොමැතිවීමෙන් සභාවට අමතරව දැරීමට සිදුවන පිරිවැය නිසි කළමනාකරණයක් යටතේ සිදුකර නොතිබුණි.

(ii) සභා ශාලාව නවීකරණය කිරීමේ කොන්ත්‍රාත්තුව තුළ ඇතුලත් කර තිබූ සභා ශාලාවේ ආසන,වායු සමීකරණ යන්ත්‍ර, ශබ්ද විකාශන හා පටිගත කිරීමේ පද්ධති අදාල කොන්ත්‍රාත් ආයතනය මගින් සපයා ගැනීමට නිර්දේශ කර තිබීම නිසා, වෙළඳපොළ තුළින් ඍජුවම, අවම පිරිවැයක් යටතේ, තත්ත්වයෙන් හා නිමැවුමෙන් වඩාත් උසස් භාණ්ඩ ප්‍රසම්පාදනය කර ගැනීමට තිබූ අවස්ථාව මඟ හැරී තිබුණි. මෙය ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 1.2.1 (අ) හා (ඇ) හි ප්‍රසම්පාදන අරමුණුවලට පටහැනිවීමකි.

(iii) 2018 පෙබරවාරි 15 වන දිනට පෙර වැඩ අවසන් කර භාර දිය යුතු බවට කොන්ත්‍රාත් ආයතනය වෙත දන්වා තිබුණද , 2018 මාර්තු 14 දින වන විටත් අවසන් කර නොතිබූ අතර දින දීර්ඝ කරගෙනද නොතිබුණි.

(ආ) තුඩැල්ල කුඹුක්ගහවෙල්ල දෙපා ඇල හරහා ඇඳි පාලමක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය සඳහා පිළියෙල කර තිබූ රු.2,553,779 ක් වූ ඇස්තමේන්තු වටිනාකමට කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබූ අතර ගිවිසුම අනුව කර්මාන්තය මාස 02 කින් නිමකළ යුතු වුවද, 2017 ඔක්තෝබර් වන විටත් මෙම කර්මාන්තය ඉටුකර නොතිබුණි. එසේ කර්මාන්තය අත්හැරීමට හේතු අනාවරණය නොවූ අතර, සභාවට සිදු වූ පාඩුව අවම කරගැනීම සඳහා රු.128,000 ක් වූ කාර්යසාධන සුරක්ෂණය මුදල් කරගෙන නොතිබුණි.

(ඇ) දඩුගම ගමගේ වෙල්ල පාරේ දෙපා ඇල හරහා ඇඳි පාලමක් ඉදිකිරීම රු.2,575,428 ක වටිනාකමකට මාස 02 කින් නිම කිරීමට 2014 ඔක්තෝබර් 20 දින කොන්ත්‍රාත්කරුවකු සමඟ ගිවිසුම් ගතවී තිබුණි. ව්‍යාපෘතියේ ඇස්තමේන්තු අයිතම 23 කින් අයිතම 12 ක් පමණක් ඉටුකර තිබූ අතර, රු.537,835 ක් වූ අයිතම 11 ක් ඉටුකර නොතිබුණි. ව්‍යාපෘතිය සාර්ථකව නිමකර ඇති බවට නිර්දේශ කිරීමෙන් පසු සියයට 50 ක් වන රු.1,006,720 ක් 2015 සැප්තැම්බර් 30 දින හා ඉතිරි සියයට 50 වන රු.1,006,720 ක් 2017 මැයි 15 දින ගෙවීම් කර තිබුණි. වර්ෂ දෙකකට ආසන්න ප්‍රමාදයකින් පසු අවසාන ගෙවීමට අදාළව තාක්ෂණ නිලධාරි විසින් ව්‍යාපෘතියේ වාර්තමාන තත්ත්වය පිළිබඳ වාර්තාවක් සපයා නොතිබුණි. තවද පාලමේ ඇඳි සවිකර නොතිබීම නිසා මෙම පාලම ඉතාමත් අනතුරුදායක තත්ත්වයක තිබෙන බව හා පස් පුරවා තිබූ කොටසක විශාල වලක් සෑදී

තිබීමෙන් මෙම ඉදිකිරීම සාර්ථක ඉදිකිරීමක් නොවන බව 2017 නොවැම්බර් 01 දින ස්ථානීය පරික්ෂාවේදී නිරීක්ෂණය විය.

4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය
-----------------------------------------

4.1 අභ්‍යන්තර විගණනය
------------------------

ආයතනය තුළ ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

5. පද්ධති හා පාලන
--------------------

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර ලේකම්වරයාගේ අවධානයට යොමුකර ඇති අතර, පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

| | පද්ධතිය | අඩුපාඩුව |
|---|---|---|
| (අ) | ආදායම් පාලනය | අනවසරයෙන් පවත්වාගෙන යන කඩ සම්බන්ධයෙන් කටයුතු නොකිරීම හා හිඟ අය කර ගැනීමට කටයුතු නොකිරීම. |
| (ආ) | ගිණුම්කරණය | ස්ථාවර වත්කම් ප්‍රාග්ධනගත නොකිරීම හා ශේෂ සනාථ කිරීම් නොතිබීම. |
| (ඇ) | ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම | ප්‍රසම්පාදන සැලැස්මක් නොමැතිවීම හා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී විනිවිදභාවයක් නොමැති වීම. |
| (ඈ) | වත්කම් පාලනය | සමහර වත්කම් සමීක්ෂණයට ඉදිරිපත් නොකිරීම. |